# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2256/34 – 2021 දෙසැම්බර් මස 01 වැනි බදාදා – 2021.12.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස – පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ කිරාහන්දි තිලකරත්න ද සිල්වා අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූද, එම කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඔපාත කංකානන්ගේ දම්මික සුසන්ත නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද;

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, වේවැල්වල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ඔපාත කංකානන්ගේ දම්මික සුසන්ත, කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරි,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2021 දෙසැම්බර් මස 01 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

EOG 12-0005

1A – G 35477 – 20 (2021/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*